සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**පෙරහුරු පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2022**
**Practice Test - Grade 13 - 2022**

**භූගෝල විද්‍යාව - II** | **22 S II**


**පැය තුනයි**

විභාග අංකය: ..................................................

* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් වත් තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

01.




i. (a) ඉහත රූපසටහනේ දැක්වෙන පෘථිවි ව්‍යුහයේ A B C ස්තර නම් කරන්න. **(ල 03)**


(b) පෘථිවි ව්‍යුහයට අයත් ස්තර අතරින් ශිලාගෝලයට අයත් අසන්තතික කලාප දෙක නම් කරන්න **(ල 02)**

ii. පෘථිවි කබොලේ කැපී පෙනෙන ලක්ෂණ පැහැදිලි කරන්න. **(ල 05)**

iii. පෘථිවි ව්‍යුහයේ ස්තර අතර හඳුනාගත හැකි සුවිශේෂී වෙනස්කම් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ල 06)**

iv. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ශිලාගෝලයට ඇතිවන බලපෑම් දෙකක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. **(ල 04)**

02. ලෝකයේ යමහල් ක්‍රියාකාරීත්වය හා භූමිකම්පා නිශ්චිත ප්‍රදේශවලට පමණක් සීමා වී ඇත.




මූලාශ්‍රය: අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, භෞතික භූගෝල විද්‍යාව (2009)

i. සිතියමේ දැක්වෙන යමහල් කලාප හතර නම් කරන්න. **(ල 04)**

ii. නිෂ්ක්‍රාන්ත යමකම ක්‍රියාවලිය ආශ්‍රිත භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් සහිත ව විස්තර කරන්න. **(ල 06)**

iii. යමහල් ආශ්‍රිත ව සිදුකරන මානව කටයුතු තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න

03. i. ශුෂ්ක භූ රූප හා කාස්ට් භූ රූප යන්න හඳුන්වන්න **(ල 04)**

ii. ශුෂ්ක භූ රූපවල ඛාදන ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න. **(ල 06)**

iii. ශුෂ්ක ප්‍රදේශවල ඛාදනයෙන් නිර්මාණය වන භූ රූප තුනක නිර්මාණ ක්‍රියාවලිය රූපසටහන් සහිත ව විස්තර කරන්න. **(ල 06)**

iv. කාස්ට් ප්‍රදේශවල නිධිසාදනයෙන් නිර්මාණය වන භූ රූප දෙකක් රූප සටහන් මගින් පැහැදිලි කරන්න. **(ල 04)**

04. i. බියෝමය හා පරිසර පද්ධතිය යන්න වෙන වෙන ම හඳුන්වන්න **(ල 04)**

ii. ලෝකයේ විවිධ ප්‍රදේශවල දක්නට ලැබෙන බියෝම වර්ග හතරක් නම් කරන්න. **(ල 04)**

iii. කෙපන්ගේ දේශගුණ වර්ගීකරණයේ නිවර්තන දේශගුණ (A) වර්ගයට අයත් උප වර්ගයක හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණ පහත මාතෘකා යටතේ නිදසුන් සහිතව පැහැදිලි කරන්න. **(ල 06)**

(a) ව්‍යාප්තිය

(b) දේශගුණික ලක්ෂණ

(c) ශාක හා සත්ත්ව ව්‍යාප්තිය

iv. ඉහත අංක ( iii ) හි ඔබ දැක්වූ බියෝම පද්ධතියේ පැවැත්මට තර්ජනයක් එල්ල කරන මානව ක්‍රියාකාරකම් තුනක් විස්තර කරන්න. **(ල 06)**

## II කොටස මානුෂ භූගෝල විද්‍යාව

05. වගු අංක 01

**ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යා වර්ධනය 2015**

| සංගණන වර්ෂය | ජනසංඛ්‍යාව (මිලියන) | වාර්ෂික වර්ධන සීඝ්‍රතාවය |
|---|---|---|
| 1871 | 2400.4 | |
| 1881 | 2759.8 | 1.4 |
| 1891 | 3007.8 | 0.9 |
| 1901 | 3566.0 | 1.7 |
| 1911 | 4106.4 | 1.4 |
| 1921 | 4497.9 | 0.9 |
| 1931 | 5306.9 | 1.7 |
| 1946 | 6657.3 | 1.5 |
| 1953 | 8097.9 | 2.8 |
| 1963 | 10582.0 | 2.6 |
| 1971 | 12689.9 | 2.2 |
| 1981 | 14846.8 | 1.7 |
| 2001 | 18797.3 | 1.2 |
| 2012 | 20359.4 | 0.7 |

**මූලාශ්‍රය ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව**

i. (a) රටක සංඛ්‍යාවේ වර්ධනයට බලපාන සාධක තුනක් නම් කරන්න (ල 3)
(b) ඉහත වගුවට අනුව ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනයේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් ලියා දක්වන්න. (ල 3)

ii. ශ්‍රී ලංකාවේ උපත් අනුපාතිකය පහළ යාමට බලපා ඇති සාධක තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ල 06)

iii. උපත් අනුපාතිකය පහළ යාම නිසා ඇති විය හැකි ගැටළු දෙකක් සාකච්ඡා කරන්න (ල 04)

iv. ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධන සීඝ්‍රතාවයේ අවකාශීය වශයෙන් කැපී පෙනෙන ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ල 04)

06. ශ්‍රී ලංකාව අතීතයේ සිටම කෘෂිකාර්මික රටක් විය. අපේ පැරැන්නන් පරිසර හිතකාමී කෘෂිකාර්මික ජීවන රටාවක් මගින් ස්වයංපෝෂිත ආර්ථිකයක් ගොඩනගා ගත් බවට සාක්ෂි ඇත.

i. ඓන්ද්‍රිය කෘෂිකර්මාන්තය යන්න පැහැදිලි කරන්න. (ල 02)

ii. ඓන්ද්‍රිය කෘෂිකර්මාන්තයේදී භාවිතා කරනු ලබන ප්‍රධාන ක්‍රමවේද තුනක් පැහැදිලි කරන්න.(ල 06)

iii. වර්තමාන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටළු තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න. (ල 06)

iv. ශ්‍රී ලංකාවේ කෘෂි නිෂ්පාදන අලෙවිකරණ ක්‍රියාවලියේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් සාකච්ඡා කරන්න. (ල 06)

07. i. ලෝකයේ ප්‍රධාන කර්මාන්ත වර්ග දෙක කෙටියෙන් පැහැදිලි කරන්න (ල 04)

ii. පහත සඳහන් කලාපවල පෙට්‍රෝලියම් නිෂ්පාදනය කරන රට බැගින් නම් කරන්න. (ල 04)

(a) මැදපෙරදිග කලාපය

(b) දකුණු ඇමරිකානු කලාපය


(c) ආසියානු කලාපය

(d) අප්‍රිකානු කලාපය

iii. ලෝක පෙට්‍රෝලියම් වෙළඳාමේ කැපී පෙනෙන ලක්ෂණ තුනක් නිදසුන් සහිත ව පැහැදිලි කරන්න (ල 06)

iv. වර්තමාන ශ්‍රී ලංකාවේ පෙට්‍රෝලියම් ආනයනයේ අර්බුදකාරී තත්ත්වය නිසා රට තුළ පැන නැගී ඇති ගැටළු තුනක් නිදසුන් සහිතව පැහැදිලි කරන්න. (ල 06)

08. 2013/2014 වර්ෂවල ශ්‍රී ලංකාවට සංචාරකයින් පැමිණි ප්‍රධාන රටවල් 10 ප්‍රස්ථාරයේ දැක්වේ.




i. 2013 වර්ෂයට සාපේක්ෂ ව 2014 වර්ෂයේ ශ්‍රී ලංකාවට වැඩි ම සංචාරකයින් පැමිණි රටවල් හතර පිළිවෙලින් නම් කරන්න (ල 4)

ii. ශ්‍රී ලංකාවේ සංචාරක මණ්ඩලය විසිනු බෙදා වෙන් කරන ලද ප්‍රධාන සංචාරක කලාප වලට අයත් එක් ප්‍රදේශය බැගින් නම් කරන්න. (ල 4)

(a) මහ කොළඹ කලාපය

(b) දකුණු වෙරළ කලාපය

(c) උස්බිම් ප්‍රදේශය

(d) පුරාතන නගර

iii. ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන සංචාරක කර්මාන්තයේ නව ක්ෂේත්‍ර තුනක යෝග්‍යතාවය පැහැදිලි කරන්න. (ල 06)

iv. වර්තමානයේ ශ්‍රී ලංකාව තුළ ඇතිවූ විවිධ අර්බුද සංචාරක ක්ෂේත්‍රයේ පසු බැසීමට හේතු වූ ආකාරය කරුණු තුනක් ඇසුරින් පහදන්න. (ල 06)

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - පෙරහුරු පරීක්ෂණය

භූගෝල විද්‍යාව - 13 ශ්‍රේණිය 2022




SCALE : 1:50,000

සමෝච්ඡ රේඛා අන්තරය මීටර් 20